# 18. ශාරෙපත්හි වැන්දඹුව


මම ජීවත් වෙන්නේ ශාරෙපත් නගරයේ. මගේ සැමියා මැරිලා මට පුංචි පුතෙක් ඉන්නවා. අපි හරි ම අමාරුවෙන් තමයි ජීවත් වුණේ.

ඔහොම ඉන්න කොට අපේ රටේ ලොකු නියඟයක් ඇති වුණා. ගංගා හිඳිලා ගියා. කෑමක් නැති වුණා.

මා ළඟ ඉතිරිවෙලා තිබුණේ පිටි ටිකකුත්, තෙල් ටිකකුත් විතරයි. ඒ ටික ඉවර වුණා ම හාමතේ මැරෙන්න සිදු වෙයි කියලා මට හිතුණා. ඉතින්, ඒ අන්තිම පිටි ටිකෙනුත් තෙල් ටිකෙනුත් මටත් පුතාටත් රොටි දෙකක් හදා ගෙන කන්න හිතාගෙන එදා මම දර ටිකක් ඇහුලුවා. මම දර අහුලමින් ඉන්න කොට, කවුදෝ මිනිසෙක් එතනට ඇවිල්ලා වතුර ටිකක් ඉල්ලුවා. මම වතුර ගේන්න යන කොට ඔහු කියනවා "පුළුවන් නම් මට රොටියකුත් ගෙනත් දෙන්න" කියලා. මම ඔහුට කිවුවා අන්තිම පිටි ටික හා තෙල් ටික පමණක් මා ළඟ ඉතිරි වෙලා තියෙන බව.

ඒත් ඔහු කීවේ පළමු ව ඔහුට රොටියක් හදන්න, ඉන් පසු මට රොටියක් හදා ගන්න කියා. ඔහු කී විදියට ම මම කළා.

ඉතින් ඔයාලා දන්නවා ද? හරිම පුදුම දෙයක් සිදු වුණා. නියං කාලය ඉවර වෙන තුරු ම, මගේ පිටි මුට්ටියේ පිටිවත්, තෙල් කුලාවේ තෙල්වත් ඉවර වුණේ නැහැ. දෙවියන් වහන්සේට ප්‍රශංසා වේවා !



## පැවරුම්

1. පිටි, පොල්, තෙල් ගෙන රොටියක් සාදා එය බෙදා ගෙන කන්න.
2. මේ කතාව අනුව රොටිය බෙදා ගත් අයගේ නම් අභ්‍යාස පොතේ ලියන්න.